# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය - 2024


6 - ශ්‍රේණිය | ගණිතය | කාලය - පැය 2

නම -

## I – කොටස

**1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ**

1) වෘත්තය තුළ පිහිටි අක්ෂර මොනවාද ?




2) හිස්තැන් පුරවන්න.

ත්‍රිකෝණයක පාද .................. ක්ද, චතුරස්‍රයක පාද .................. ක්ද ඇත.

3) එකතු කරන්න.

$5632 + 156 + 29$


4) 'එක් මිලියන අටසිය විසිපන්දහස් දෙසිය හත' ඉලක්කමෙන් ලියන්න.


5) 4536 යන සංඛ්‍යාවේ,

a) 5 මගින් නිරූපිත අගය කුමක්ද ?

b) 3 හි ස්ථානීය අගය කුමක්ද ?

6) රූප සටහනේ දක්වා ඇති ඝනවස්තු නම් කරන්න.





7) යා කරන්න.

| සංඛ්‍යාව | ආසන්න 10 ගුණාකාරයට වටැයූ විට |
|---|---|
| 58<br>69<br>62<br>74 | 60<br>70 |


8) සුළු කරන්න.

$1200 \div 100$

9) මිනිත්තු 247, පැය හා මිනිත්තුවලින් දක්වන්න.

10) 432☐ යන සංඛ්‍යාව 5න් ඉතිරි නැතිව බෙදීමට නම් හිස් කොටුවට යෙදිය යුතු ඉලක්කම් මොනවාද ?


11) පහත ඔරලෝසුවේ දක්වා ඇති වේලාව සාමාන්‍ය ආකාරයෙන් ලියා දක්වන්න.




12) පහත දැක්වෙන සංඛ්‍යා රටාවේ ඊළඟ පද 2ක ලියන්න.

4 , 9 , 14 , ………… , ……………

13) පැන්සලෙහි දිග $cm$ හා $mm$ වලින් දක්වන්න.





14) මෙම රූප සටහනේ,

$i$) තිරස් තලයක පිහිටි ද්‍රව්‍යයක් නම් කරන්න.

$ii$) සිරස් තලයක පිහිටි ද්‍රව්‍යයක් නම් කරන්න.




15) පහත රූප සටහන්වලින් දැක්වෙන භාගය ඒකක භාගයක් නම් එම රූපයේම √ ලකුණ යොදන්න.



16) $3l\ 25ml$, මිලිලීටරවලින් දක්වන්න.

17) රූපයේ දැක්වෙන භාජනයේ ඇති පබළු ගණන 24ක් වේ. භාජනයට පිරවිය හැකි පබළු ප්‍රමාණය නිමානය කරන්න




18) හිස්තැන් පුරවන්න.

12 හි සියළුම සාධක වන්නේ 1 , 2 , ☐ , 4 , ☐ , 12

19) පහත සංඛ්‍යාවේ දෙවන දශමස්ථානය ◯ කර, පළමු දශමස්ථානය මත × යොදන්න.

2 3 . 5 6

20) සංඛ්‍යාවේ රේඛාවේ නිරූපණය වන නිඛිල දක්වන්න.





A - ……………………………
B - ……………………………
C - ……………………………
D - ……………………………

# II - කොටස

- පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක්ද, ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින්ද හිමිවේ.


1) $(a)$ පහත සමූහය පොදු වූ ලක්ෂණයක් යටතේ කාණ්ඩ 2කට වෙන් කොට එම කාණ්ඩ දෙක නම් කරන්න.

**සමචතුරස්‍රය, ඝනකය, සමාන්තරාස්‍රය, චතුස්තලය, සෘජුකෝණාස්‍රය, ඝනකාභය**



------------------------- -------------------------  (ලකුණු - 6)


$(b)$



$i)$ මෙම පතරම භාවිතයෙන් සෑදිය හැකි ඝනවස්තුවේ නම කුමක්ද? (ලකුණු - 1)

$ii)$ එම ඝනවස්තුවේ දාර ගණන, ශීර්ෂ ගණන හා මුහුණත් ගණන ලියන්න. (ලකුණු - 3)

$(c)$ පහත රූප අතරින් සංවෘත සරල රේඛීය තලරූප තෝරන්න.




(ලකුණු - 2)

$(d)$ පහත වගන්ති සත්‍ය නම් √ ලකුණද, අසත්‍ය නම් × ලකුණද යොදන්න.

i. සමචතුරස්‍රයේ සියලු පාද දිගින් සමාන වේ. (   )
ii. රොම්බසයේ සියලු පාද දිගින් සමාන නොවේ. (   )
iii. ත්‍රපීසියමේ සම්මුඛ පාද යුගළ 2ම එකම පරතරයකින් පිහිටයි. (   )
iv. සෘජුකෝණාස්‍රයේ සියලු කෝණ සෘජුකෝණී වේ. (   ) (ලකුණු - 4)

2) $(a)$ i. හරය 7 හා ලවය 4 වූ භාගය ලියන්න. (ලකුණු - 1)

ii. $\frac{3}{5}$ භාගය සඳහා තුල්‍ය භාග 2ක් ලියන්න. (ලකුණු - 2)


$(b)$ විශාල භාගය තෝරන්න. $\frac{3}{4}$ , $\frac{2}{3}$ (ලකුණු - 2)

$(c)$ සුළු කරන්න

i. $\frac{1}{7} + \frac{2}{7}$ (ල - 1) ii. $\frac{14}{15} - \frac{7}{15}$ (ල - 1) iii. $\frac{5}{8} + \frac{1}{4}$ (ල - 2) iv. $\frac{7}{9} - \frac{2}{3}$ (ල - 2)


3) $(a)$ i. $8m\ 45cm$ , සෙන්ටිමීටරවලින් දක්වන්න. (ලකුණු - 2)

ii. දී ඇති සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න. (ලකුණු - 2)




iii. ඉහත සෘජුකෝණාස්‍රයේ පරිමිතියම ඇති සමචතුරස්‍රයක, පැත්තක දිග සොයන්න. (ලකුණු - 2)

$(b)$





i. $C$ භාජනයේ පරිමාව $l$ හා $ml$ දක්වන්න. (ල-1)

ii. $B$ භාජනයේ පරිමාව $ml$ වලින් දක්වන්න. (ල-2)

iii. $C$ භාජනයට වඩා $A$ භාජනයේ ඇති ජල පරිමාව සොයන්න. (ල-2)

4) i. ගණක රාමුවෙහි සනක මගින් දැක්වෙන දශම සංඛ්‍යාව ලියන්න. (ලකුණු - 2)




ii. 12.04 කියවන ආකාරය ලියන්න. (ලකුණු - 2)

iii. පහත සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියන්න. (ලකුණු - 3)

0.65 , 0.5 , 0.58 , 6.05


iv. සුළු කරන්න

$(a)$
$$\begin{array}{r} 13.45 \\ +\ 9.09 \\ \hline \\ \hline \end{array}$$

$(b)$
$$\begin{array}{r} 5.05 \\ -\ 2.85 \\ \hline \\ \hline \end{array}$$

(ලකුණු - 4)

5) $(a)$



i. ඉහත රටාවේ ඊළඟ අවස්ථා 2 තිත් මගින් නිරූපණය කරන්න. (ලකුණු - 2)

ii. එම සංඛ්‍යා රටාව හඳුන්වන නම ලියන්න. (ලකුණු - 2)

iii. එහි 8 වන අවස්ථාව නිරූපණය සඳහා අවශ්‍ය වන තිත් සංඛ්‍යාව කොපමණද ? (ලකුණු - 2)

iv. ඉහත $(iii)$ හි අවශ්‍ය තිත් සංඛ්‍යාව, සමචතුරස්‍ර සංඛ්‍යා රටාවේ කී වෙනි අවස්ථාවද ? (ලකුණු - 2)

$(b)$ 10 ත් 60 ත් අතර 15 ගුණාකාර ලියන්න. (ලකුණු - 3)


6) $(a)$ සුදුසු අගයන් යොදා හිස්තැන් පුරවන්න. (ලකුණු - 4)

(i)
$$\begin{array}{r} 3\ \square\ 5\ 8 \\ +\ 4\ 3\ 4\ \square \\ \hline 7\ 6\ 0\ 0 \\ \hline \end{array}$$

(ii)
$$\begin{array}{r} 5\ \square\ 6 \\ -\ 1\ 9\ \square \\ \hline 3\ 3\ 4 \\ \hline \end{array}$$

(iii) මල්ලක දොඩම් ගෙඩි 25ක් ඇත එවැනි මලු 18ක දොඩම් ගෙඩි ගණන සොයන්න. (ලකුණු - 2)


$(b)$ රූප සටහනේ අංක මගින් දැක්වෙන කෝණ නම් කරන්න.




1 - ------------------------
2 - ------------------------
3 - ------------------------
4 - ------------------------
5 - ------------------------

(ලකුණු - 5)

7) දිශා ආශ්‍රිතව දී ඇති සැලැස්මට අනුව පහත හිස්තැන් පුරවන්න.




i. ළමයාට ........................දිශාවෙන් ළිඳද, ළිඳට........................ දිශාවෙන් ළමයාද සිටියි.

ii. ගසට..................... දිශාවෙන් ළමයා සිටින අතර, ළමයාට .....................දිශාවෙන් ගස තිබේ.

iii. ළමයාට.................. දිශාවෙන් පාසලද, පාසලට.................. දිශාවෙන් ළමයාද ඇත .

iv. පන්සලට..................දිශාවෙන් ළමයාද, ළමයාට................ දිශාවෙන් නිවසද තිබේ.

v. ළමයාට ගිණිකොණ දිශාවෙන් ........................ ද, පල්ලියට ..................දිශාවෙන් ගසද, පාසලට ............................... දිශාවෙන්ද ගස පිහිටා ඇත.

(ලකුණු - 1 X 11)

PARCEL NO

# LOL.lk BookStore



# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**